WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

40 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2016

| | | |
|---|---|---|
| සංගීතය (පෙරදිග) | I, II | පැය තුනයි |
| சங்கீதம் (கீழைத்தேய) | I, II | மூன்று மணித்தியாலம் |
| Music (Oriental) | I, II | Three hours |

## සංගීතය (පෙරදිග) I

**සැලකිය යුතුයි :**
- (i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- (ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති **(1), (2), (3), (4)** උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.
- (iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
- (iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** පහත සඳහන් රාග අතුරෙන් වැඩිම විකෘති ස්වර සංඛ්‍යාවක් යෙදෙන රාගය කුමක් ද?
(1) බිලාවල් (2) කාෆි (3) යමන් (4) භෛරවී

**2.** ස්වර සප්තකය තුළ ඇති චල ස්වර සංඛ්‍යාව වනුයේ,
(1) 1 කි. (2) 5 කි. (3) 7 කි. (4) 12 කි.

**3.** එකම මේලයෙන් උපදින නිර්දේශිත රාග යුගලයකට නිදසුනකි,
(1) බිලාවල් සහ කාෆි (2) භූපාලි සහ යමන් (3) යමන් සහ කාෆි (4) බිලාවල් සහ කාෆි

**4.** කාෆි රාගය සඳහා අදාළ නිවැරදි තොරතුර තෝරන්න.
(1) ශුද්ධ 'ග' සහ 'නි' ස්වර දෙක විවාදි ස්වර ලෙස යොදා ගැනීම
(2) ෂාඩව සම්පූර්ණ රාගයක් වීම
(3) කෝමල 'ග' සහ කෝමල 'නි' ස්වර දෙක වාදි සංවාදි ලෙස යොදා ගැනීම
(4) ස, රි, ම, ප, ධ යන ස්වර අනුවාදි ස්වර ලෙස යොදා ගැනීම

**5.** සධ, සරිග, පග යන ස්වර ඛණ්ඩය කුමන රාගයකට අයත් වේ ද?
(1) භූපාලි (2) බිලාවල් (3) යමන් (4) කාෆි

**6.** නිරිස, නිරිගරිස යන ස්වර අභ්‍යාසයෙහි ඊළඟ ස්වර ඛණ්ඩය යමන් රාගයට අනුව දැක්වෙන්නේ කෙසේ ද?
(1) නි රි ග ම ග රි ස (2) නි රි ග ම් ග රි ස (3) නි රි ග ප ග රි ස (4) නි රි ප ම් ග රි ස

**7.** රාත්‍රි ප්‍රථම ප්‍රහරය තුළ ගැයෙන නිර්දේශිත රාගය තෝරන්න.
(1) කාෆි (2) භෛරවී (3) බිලාවල් (4) භූපාලි

● අංක **8** සහ **9** ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් තානාලංකාරය උපයෝගී කරගන්න.

ගප ධනි ස්නි ධප | ගප මග මරි ස-

**8.** ඉහත තානාලංකාරය කුමන තාන වර්ගයකට අයත් වේ ද?
(1) අලංකාරික තාන් (2) බෝල් තාන් (3) මිශ්‍ර තාන් (4) සපාට් තාන්

**9.** එම තානාලංකාරය කුමන රාගයකට අයත් වේ ද?
(1) බිලාවල් (2) කාෆි (3) භූපාලි (4) භෛරවී

**10.** රාග ජාතියට අනුව සම්පූර්ණ වර්ගයට අයත් **නො වන** රාගය තෝරන්න.
(1) යමන් (2) කාෆි (3) භූපාලි (4) භෛරවී

[දෙවැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**11.** භූපාලි සහ යමන් යන රාග යුගලය සඳහා පොදුවේ අදාළ **නො වන** කරුණ තෝරන්න.

(1) ගාන සමය සමාන වීම ය.
(2) මේලය සමාන වීම ය.
(3) සංවාදි ස්වර සමාන වීම ය.
(4) වාදි ස්වරය සමාන වීම ය.

**12.** 'සරිප' වශයෙන් ස්වර සංගතියක් යෙදෙන රාගය තෝරන්න.

(1) බිලාවල් (2) යමන් (3) කාෆි (4) භූපාලි

**13.** ස්වර සප්තකය තුළ අර්ධ ස්වර පරතරයක් සහිත ස්වර යුගලය තෝරන්න.

(1) ග සහ ම (2) ම සහ ප (3) ප සහ ධ (4) ධ සහ නි

**14.** නිර්දේශිත රාගයකට අයත් නිවැරදි සර්ගම් පාදය තෝරන්න.

(1) ස ස රි රි | ග ග ම ම | ප - - ම | ප ධ නි සං̇
(2) ස ස රි රි | ග ග ම́ ම́ | ප - - ම́ | ප ධ නි සං̇
(3) ස ස රි රි | ග̲ ග̲ ම ම | ප - - ම | ප ධ නි̲ සං̇
(4) ස ස රි̲ රි̲ | ග̲ ග̲ ම ම | ප - - ම | ප ධ̲ නි̲ සං̇

**15.** සර්ගම් ප්‍රබන්ධ විශේෂය සඳහා අදාළ **නො වන** කරුණ තෝරන්න.

(1) ස්වර පමණක් යොදා ගැනීම
(2) රාග ලක්ෂණ විස්තර කර තිබීම
(3) තාලානුකූල ව නිර්මාණය වී තිබීම
(4) රාග සංගති යොදාගෙන තිබීම

- අංක **16** සිට **18** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත ස්වර පාදය උපයෝගී කරගන්න.

| ග ප | ධ - නි | සං̇ - | ධ - ප |

**16.** ඉහත ස්වර රචනාව නිර්මාණය වී ඇත්තේ කුමන රාගයක් පදනම් කරගෙන ද?.

(1) භූපාලි (2) යමන් (3) බිලාවල් (4) කාෆි

**17.** ඉහත ස්වර රචනාව මධ්‍යම භාවයට පෙරළා ප්‍රස්තාරගත කරන්නේ කෙසේ ද?

(1) | ධ සං̇ | රි̇ - ගං̇ | මං̇ - | රි̇ - සං̇ |
(2) | ධ̲ සං̇ | රි̇ - ගං̇ | මං̇ - | රි̇ - සං̇ |
(3) | ධ සං̇ | රි̇ - ගං̲̇ | ම̇́ - | රි̇ - සං̇ |
(4) | ධ සං̇ | රි̲̇ - ගං̇ | ම̇́ - | රි̲̇ - සං̇ |

**18.** එම ස්වර රචනාව අයත් වන තාලය තෝරන්න.

(1) දීප්චන්දි (2) දාදරා (3) ජප් (4) බෙම්ටෝ

- අංක **19** සිට **22** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් සටහන උපයෝගී කරගන්න. එහි දැක්වෙනුයේ නිර්දේශිත තාල හතරකින් උපුටාගත් තාල සංකේත සහිත විභාග හතරකි.

| A | B | C | D |
|---|---|---|---|
| ධා ධිං ධිං ධා | ධි ධි න | ත තිං S | ධි න |
| × | 2 | 0 | 3 |

**19.** ජප් තාලයට අයත් විභාගය දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය තෝරන්න.

(1) A (2) B (3) C (4) D

**20.** තබ්ලාවේ දායාව (දහිනා) සහ බායාව එකවර වැයීමෙන් නිකුත් වන අවනද්ධාක්ෂර පමණක් අයත් විභාගය තෝරන්න.

(1) A (2) B (3) C (4) D

**21.** තාලයට අදාළ සෑම විභාගයක ම එක සමාන මාත්‍රා සංඛ්‍යාව බැගින් යෙදෙන නිර්දේශිත තාල දෙකක් ඇතුළත් වනුයේ,

(1) A සහ B තුළ ය. (2) A සහ D තුළ ය. (3) B සහ C තුළ ය. (4) B සහ D තුළ ය.

**22.** C අක්ෂරයට අදාළ උත්තර භාරතීය තාලයට බොහෝ සෙයින් සමානත්වයක් පෙනෙන දේශීය බෙර පදය තෝරන්න.

(1) දෝ́ං ජිං | ජිං́ ග ත |
(2) දෝ̂ ං | ජි́ ං ත | ගි̂ ත | දෝ́ ං ත
(3) දෝ̂ ං දො | ජි́ ං ග ත | ජි̂ ග ත | දෝ́ ං ත ක
(4) දෝ́ මි | කි́ ට | කි́ ට | දෝ́ මි |

/තුන්වැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

- අංක **23** සිට **26** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් ගී පාද උපයෝගී කරගන්න.

  A - රැගත් සුරා පිරූ විතින්

  B - දොඩම් කපාලා ඇඹුල් තනාලා

  C - අප ගුණ සරු සිංහල භූපති

  D - දූල් නිමල් සිසි සේ දිසි සරදඹරේ

  E - කළුවන් කළු රුවයි මංගෝ දිලිසෙනවා

  F - කළු ගල් තලාලයි පාරට දමන්නේ

**23.** සේ ගී ගණයට ගැනෙන ගී පාදය දැක්වෙන ඉංග්‍රීසි අක්ෂරය වන්නේ,
(1) A ය. (2) B ය. (3) D ය. (4) F ය.

**24.** අනාසාතාත්මක ගැමි ගී දෙකක් සටහන් ව ඇති ඉංග්‍රීසි අක්ෂර යුගලය වන්නේ,
(1) A සහ B ය. (2) B සහ C ය. (3) D සහ E ය. (4) E සහ F ය.

**25.** දේශීය රංග සම්ප්‍රදායන් දෙකකට අයත් ගී පාදයන් දැක්වෙන්නේ කුමන ඉංග්‍රීසි අක්ෂර මගින් ද?
(1) A සහ B (2) B සහ C (3) C සහ D (4) E සහ F

**26.** කෙළි ගී ගණයට අයත් වන ගී පාදයට අදාළ ඉංග්‍රීසි අක්ෂරය වන්නේ,
(1) B ය. (2) C ය. (3) D ය. (4) E ය.

**27.** විෂම ග්‍රහයෙන් ගායනා කළ යුතු ගී පාදය තෝරන්න.
(1) ප්‍රේමයෙන් මන රංජිත වේ (2) මුළු ගතම වෙහෙසුණා
(3) දැඩි කළ මාතා (4) ආදරයේ උල්පත වූ අම්මා

**28.** නෙළුම් ගී තනු පාදක කරගනිමින් ප්‍රතිනිර්මාණය වූ "දැතට වළලු ...." ගීය නිර්මාණය කළ දේශීය සංගීතඥයා වන්නේ,
(1) ඩබ්ලිව්. බී. මකුලොළුව සූරීන් ය. (2) සී. ද ඇස් කුලතිලක සූරීන් ය.
(3) රෝහණ බැද්දගේ සූරීන් ය. (4) ලයනල් රන්වල සූරීන් ය.

**29.** මෙහෙ ගී වර්ග දෙකක් සහිත වරණය තෝරන්න.
(1) බැති ගී, දරු නැළවිලි ගී (2) පතල් ගී, රබන් ගී
(3) පාරු ගී, ගැල් ගී (4) ගොයම් ගී, කෙළි ගී,

**30.** ගැමි ගී සඳහා අදාළ වන තොරතුර තෝරන්න.
(1) භාරතීය සංගීතඥයින් විසින් තනු නිර්මාණය කරන ලද ගැමි ගීත ද ඇත.
(2) විවිධ වෘත්තීන් හා ඇදහිලි මත පදනම් වූ ගැමි ගීත ද ඇත.
(3) උගතුන් විසින් රචනා කරන ලද ගැමි ගීත ද ඇත.
(4) සන්දේශ කාව්‍යවල සමුද්‍රඝෝෂ විරිතෙන් ගැයෙන ගැමි ගීත ද ඇත.

**31.** "සුවඳ සබන් ඇඟ ගාලා හායි හායි" ගීතය ඇතුළත් වූ නව නාට්‍යය තෝරන්න.
(1) රාජ කපුරු (2) තාරාවෝ ඉගිලෙති
(3) අබුද්දස්ස කෝලම (4) මධුර ජවනිකා

WWW.OLEVELAPI.COM

**32.** දේශීය නාඩගම් ශෛලියට අනුගත ව නිෂ්පාදනය වූ නව නාට්‍යය තෝරන්න.
(1) රතු හැට්ටකාරි (2) මනමේ (3) කුස පබාවතී (4) අන්දරේලා

- අංක **33** සහ **34** ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් ස්වර ප්‍රස්තාරය උපයෝගී කරගන්න.

  ස - ග | රි - නි | ස - ම | ග - -

**33.** ඉහත සඳහන් ස්වර ප්‍රස්තාරයට උචිත අපරදිග කෝඩ්ස් (chords) සතර පිළිවෙළින් දක්වන්නේ කෙසේ ද?
(1) C F G C (2) C G F C (3) F C G C (4) F G C F

**34.** එම ස්වර ප්‍රස්තාරය අපරදිග ක්‍රමයට ලියා දක්වන්නේ නම් ඊට ගැළපෙන ටයිම් සිග්නේචරය (time signature) කුමක් ද?
(1) $\frac{3}{3}$ (2) $\frac{3}{4}$ (3) $\frac{4}{4}$ (4) $\frac{2}{4}$

/හතරවැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**35.** චිත්‍රපට සංගීත අධ්‍යක්ෂණය සඳහා කිසිසේත් ම දායක **නොවූ** කලාකරුවා තෝරන්න.

(1) සෝමදාස ඇල්විටිගල සූරීන් (2) සරත් දසනායක සූරීන්
(3) ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ සූරීන් (4) ආචාර්ය වික්ටර් රත්නායක සූරීන්

**36.** රිද්ම රටා කිහිපයක් ඇතුළත් හා දොහොරාවක් ද සහිත චිත්‍රපට ගීතය තෝරන්න.

(1) ගලන ගඟකි ජීවිතේ (2) කුල ගෙදරින් දූම්බර කඳුවැටියේ
(3) සිනිඳු සුදුමුදු තලාවේ (4) ජීවන මේ ගමන සංසාරේ

**37.** G major ස්කේලයට අයත් ස්වර පෙරදිග ක්‍රමයට පෙළ ගස්වන අයුරු තෝරන්න.

(1) ප̣ ධ̣ නි̣ ස රි ග ම ප (2) ප̣ ධ̣ නි̣ ස රි ග ම́ ප
(3) ප̣ ධ̣ නි̣ ස රි ග̲ ම ප (4) ප̣ ධ̣ නි̤ ස රි ග ම ප

**38.** රේඛාව චිත්‍රපටයේ ඇතුළත් වුණු ගීත යුගලය තෝරන්න.

(1) සුදු සඳ එළියේ - ඕලු නෙළුම් නෙරිය රඟාලා (2) හාරිච්චි බෝරිච්චි - හීන හතක් මැද
(3) සිරි දැරූ හෙළදිව පුරාතනේ - පෙම් කැකුළ පිපී (4) පාරමිතා බල පූරිත පූජිත - පිපී පිපී රේණු නටන

**39.** මධ්‍ය පංචමය (ප) සඳහා හිමි කම්පන වාර සංඛ්‍යාතය වන්නේ,

(1) 128 ය. (2) 256 ය. (3) 384 ය. (4) 512 ය

**40.** සරල ගීයක බහුල වශයෙන් දක්නට ලැබෙන ආකෘතිය පිළිවෙළින් සඳහන්ව ඇති වරණය තෝරන්න.

(1) ස්ථායි - අන්තරා - පෙර වාදනය - අතුරු වාදනය
(2) පෙර වාදනය - ස්ථායි - අතුරු වාදනය - අන්තරා
(3) අන්තරා - පෙර වාදනය - ස්ථායි - අතුරු වාදනය
(4) අතුරු වාදනය - ස්ථායි - අන්තරා - පෙර වාදනය

* *

WWW.OLEVELAPI.COM

[පස්වැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....